**සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (සංරචක 1 - පළාත් කොටස) - 2022**
**------------------------------------------------------------------------------------------**

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ (සංරචක 1 - පළාත් කොටස) ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) අතර 2018 ජූලි 25 දින එළඹි අංක 6228 එල්කේ දරන ණය ගිවිසුමේ ප්‍රතිපාදන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා කාල සීමාව**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (MPAHAPCLG) පළාත් සම්බන්ධීකරණ අමාත්‍යාංශය වන අතර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ නවය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,505 කට සමාන එජඩො මිලියන 100 ක් වන අතර ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැයම ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කර තිබුණු අතර 2024 ජූනි 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දැක්වෙන කරුණුවලින් බලපෑම හැර, ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ලෝක බැංකුව/IDA US$ ණය ශේෂය එම දිනයේ LKR අගයට පරිවර්තනය කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දැක්වෙන ණය ශේෂය සහ සංවර්ධන වියදම් ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ශ්‍රී රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර සාධාරණ ලෙස ඉදිරිපත් කළ යුතුය. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 3/2018 හි II ඡේදය සහ 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2019 හි 9.4 ඡේදය | චක්‍රලේඛවල විධිවිධානවලට පටහැනිව ඌව පළාතේ වර්ෂය තුළ පැවති පළාත් මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් නිලධාරීන් 28 දෙනෙකු සඳහා රුපියල් 170,500 ක මුදලක් ගෙවා තිබුණි. | ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද අංක 02/2018 සැලසුම් සේවා චක්‍රලේඛය අනුව ගෙවීම් සිදු කර ඇත. කෙසේ වෙතත් ගෙවීම් තාවකාලිකව අත්හිටුවා ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව ගෙවීම් කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මෙම ව්‍යාපෘතිය යටතේ වියපැහැදම් සබැඳි දර්ශක (DLI) 09ක් සාක්ෂාත් කර ගත යුතු වුවද, 2022 වසර අවසන් වන විට සපුරාගත යුතු ඉලක්ක පෙන්නුම් කරන ප්‍රගති විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | DLIs මනිනු ලබන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය විසිනි. එබැවින් මේ සම්බන්ධ තොරතුරු සහ වගකීම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතී. | විගණක විසින් ඉල්ලා සිටින DLI ප්‍රගති වාර්තා සහ අනෙකුත් තොරතුරු ලබා දී ඇති කාල සීමාව තුළ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති සංවර්ධන අරමුණු හතරක් (PDO) හඳුන්වා දී තිබුණද, ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | PDO ප්‍රගති වාර්තා සහ විගණක විසින් ඉල්ලා සිටින අනෙකුත් තොරතුරු ලබා දී ඇති කාල සීමාව තුළ ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | දකුණු පළාත | | |
| | **(i) ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම (DLI 01)** | | |
| | ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම යටතේ 2018 සිට 2021 වර්ෂය දක්වා දකුණු පළාත තුළ පාසල් 58 ක් තෝරාගෙන තිබූ අතර, එම සංරචකය යටතේ 2022 වර්ෂය අවසාන වන විට සිසුන්ගේ කාර්යසාධන මට්ටම අවම වශයෙන් සියයට 60 ක් අපේක්ෂා කළද, ඊට අදාලව පැවැත්වූ පසු විපරම් පරීක්ෂණයේ ප්‍රතිපල විගණන දිනය වූ 2023 මැයි මස අවසානය දක්වා නිකුත් කර නොතිබුණි. නමුත් කලාප කාර්යාල 07 ක අවසාන වාර විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ලකුණු සැසඳීමේදී 8 සහ 9 ශ්‍රේණිවල සිසුන් 6243 ක් සහ 6540 කගේ ලකුණුවල සාමාන්‍යය පිළිවෙලින් සියයට 37.37 ක් සහ 37.83 ක් වී තිබුණි | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘතියෙන් අපේක්ෂා කරන අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| | **(ii) ගණිතය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම (DLI 02)** | | |
| | ගණිතය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම යටතේ 2018 සිට 2021 වර්ෂය දක්වා දකුණු පළාත තුළ පාසල් 38 ක් තෝරාගෙන තිබූ අතර, 2022 වර්ෂය අවසාන වන විට සිසුන්ගේ කාර්යසාධන මට්ටම අවම වශයෙන් සියයට 60 ක් අපේක්ෂා කළද, ඊට අදාල පැවැත්වූ පසු විපරම් පරීක්ෂණයේ ප්‍රතිපල විගණන කාලපරිච්ඡේදය වූ 2023 මැයි මස අවසානය දක්වා නිකුත් කර නොතිබුණි. නමුත් කලාප කාර්යාල 08 ක අවසාන වාර විභාගයේදී ගණිතය විෂය සඳහා ලබාගත් ලකුණු සැසඳීමේදී | -එම- | -එම- |

8 සහ 9 ශ්‍රේණියේ සිසුන් 4826 ක් සහ 5090 කින් ගණිතය විෂය සඳහා ලබාගත් ලකුණුවල සාමාන්‍යය පිළිවෙලින් සියයට 47.97 ක් සහ 44.38 ක් වී තිබුණි.

**3.2 මතභේදාත්මක ස්වභාවයේ ගැටළු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| **(අ) දකුණු පළාත** | | |
| (i) පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සියලුම ජාතික සහ පළාත් සභා පාසල්වලට පාසල් පාදක ඉගෙනුම් ප්‍රදානයන් ලබා දීම සම්බන්ධයෙන් වූ අධ්‍යාපන ලේකම්ගේ 2022 ඔක්තෝබර් 14 දිනැති අංක 34/2022 දරන චක්‍රලේඛයේ 4 වන වගන්තිය අනුව මූල්‍ය ප්‍රදාන උපයෝජනය කළ යුතු ක්ෂේත්‍ර 10 ක් (ව්‍යාපෘති සංරචකයන්ද ඇතුළත්ව) හඳුනාගෙන තිබුණි. එයින් පාසල් ලී බඩු උපකරණ මිලදී ගැනීම, නඩත්තුව හා අලුත්වැඩියා කටයුතු සඳහා සියයට 50 ක උපරිමයකට යටත්ව ගෙවීම් සිදු කළ යුතු වුවද රු. මිලියන 67 ම පාසල් 296 ක නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සඳහා පමණක් වැය කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | දරන ලද වියදම් ව්‍යාපෘති DLIs වලට අනුකූල විය යුතුය. |
| (ii)සමාලෝචිත වර්ෂයේදී රු.85,766,439 ක මුදලක් පරිගණක හා වෙනත් විද්‍යුත් උපකරණ මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි.මෙම මිලදීගත් උපකරණ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් සෘජුවම භාවිතා කර තිබූ බවක් නිරීක්ෂණය නොවුණි. එය සමස්ථ වියදමෙන් සියයට 24.8 කි. | -එම- | -එම- |
| **(ආ) වයඹ පළාත** | | |
| (i) ව්‍යාපෘතියෙහි DLI 6 දර්ශකයෙහි අරමුණ වනුයේ පාසල් ප්‍රජාව පදනම් කරගත් තත්ත්ව සහතික ස්වයං සමාලෝචන සහ බාහිර සමාලෝචන ඇති කරන පාසල් තත්ත්ව සහතිකය සඳහා ජාතික පද්ධතියක් ස්ථාපිත කිරීම වුවද, එම DLI 6 යොදා ගනිමින් රු. මිලියන 6 ක් වැයකර පුස්තකාල සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ උපකරණ මිලදීගෙන තිබුණි. | -එම- | -එම- |
| (ii)ව්‍යාපෘතියේ අරමුණු පරමාර්ථ මෙන්ම වියපැහැදම් දර්ශක (DLI) හඳුන්වා දී තිබියදී ඊට පටහැනිව කෘෂිකර්ම උපකරණ, ක්‍රීඩා උපකරණ, ගෘහ විද්‍යා උපකරණ හා සෞන්දර්ය උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 14 ක මුදලක් වැය කර තිබුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| (iii)වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 42 ක් වැයකර පරිගණක හා පරිගණක උපාංග මිලදී ගෙන තිබුණි. ව්‍යාපෘතියෙහි මූලික අරමුණ නිවැරදිව අර්ථකථනය කර ගැනීමකින් තොරව පළාත තුළ වූ පරිගණක අවශ්‍යතාවය සපුරා ගැනීමක් සිදු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මිලදී ගෙන තිබුණු ඩෙක්ස්ටොප් පරිගණක 68 ක් සහ ටැබ්ලට් පරිගණක 30 ක් බෙදා හැරීමක් සිදු නොකර ගබඩාවෙහි රඳවා තිබුණි. . එකක් රු.170,000 බැගින් මිලදීගෙන තිබූ ලැප්ටොප් පරිගණක 20 ක් වාරියපොල ගණිත සහ ඉංග්‍රීසි පුහුණු මධ්‍යස්ථානය වෙත ලබා දී තිබූ අතර විගණිත දින වූ 2023 අප්‍රේල් 18 දින වන විටත්, එම පරිගණක නිෂ්කාර්යව පැවතුණි. | -එම- | දරන ලද වියදම් ව්‍යාපෘති DLI වලට අනුකූල විය යුතුය. තොරතුරු සහ විස්තර විගණනය සඳහා ඉල්ලා සිටින විටක ඉදිරිපත් කළ යුතුය. |

### 3.3 නිශ්කාර්ය/උපයෝජනය නොකළ/ඌන උපයෝජිත සම්පත්

| අංකය | නිශ්කාර්ය වත්කම් | නිශ්කාර්ය කාලය වර්ෂ | දරන ලද පිරිවැය රු. මිලියන | හේතුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | ගුරු නිවාස - ගිරිබාව මධ්‍ය මහා විද්‍යාලය | වර්ෂ 2 | 1.1 | සඳහන් කර නොමැත. | DLI 5 අනුව නව වෘත්තීය සුදුසුකම්ලත් ගුරුවරුන් ප්‍රමාණය වැඩි කිරිම සඳහා ගෙවීම් සිදුකර ඇත. | නිල නිවාස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | විදුහල්පති නිල නිවාස - සාලිය අශෝක මධ්‍යම මහා විද්‍යාලය | වර්ෂ 2 | 1.9 | විදුහල්පතිවරයාගේ නිවස පාසල ආසන්නයේ පිහිටා ඇති අතර ගණිත ගුරුවරුන් නොමැති වීම සහ පාසලේ විද්‍යා ගුරුවරුන්ගේ හිඟයක් පැවතීම. | -එම- | -එම- |
| (ඇ) | ගුරු නිවාස - අන්ගමුව ප්‍රාථමික මහා විද්‍යාලය | වර්ෂ1 1/2 | 1.8 | පාසලේ ඉංග්‍රීසි සහ ගණිත ගුරුවරුන් නොමැති අතර තවත් ගුරුවරුන් දෙදෙනෙක් නිල නිවාසවල පදිංචිව ඇත. | -එම- | -එම- |
| (ඈ) | ඉංග්‍රීසි සහ ගණිත ඉගෙනුම් මධ්‍යස්ථානය - වාරියපොල | වර්ෂ 2 | 53.2 | (අ)අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානයට භාරදීමේ ප්‍රමාදය. | උපකරණ ලබාදුන් අතර තොග වශයෙන් විදුලි සැපයුමක් භාවිතා කිරීමට කටයුතු යොදා ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව පුහුණු මධ්‍යස්ථානය අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට |

| | | |
|---|---|---|
| අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය | (ආ)විදුලිය හා ජලය නොතිබීම, පරිශ්‍රයට ප්‍රවේශය සකස් කර නොතිබීම. | ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **වයඹ පළාත**<br>**වාරියපොල ඉංග්‍රීසි සහ ගණිත ඉගෙනුම් මධ්‍යස්ථානය ඉදිකිරීම**<br>උක්ත ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු සඳහා 2020 හා 2021 වර්ෂ වලදී රු.මිලියන 48.6 ක් ද 2022 වර්ෂයේදී රු. මිලියන 7.4 ක් ද ලෙස ඉදිකිරීම් සමාගම වෙත මුළු වටිනාකම රු. මිලියන 56 ක් ගෙවා තිබුණි. 2022 වර්ෂයේදී විදුලි සැපයුම හා භූමිය සකස් කිරීම සඳහා රු. මිලියන 4.8 ක් ද ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සඳහා රු. මිලියන 10 ක් ද ඒ අනුව 2022 දෙසැම්බර් 31 දින වන විට එම ව්‍යාපෘතිය සඳහා දරා තිබූ මුළු පිරිවැය රු. මිලියන 71 ක් විය. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති අරමුණු සඳහා හැකි ඉක්මනින් ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (i) උක්ත කර්මාන්තය සඳහා කොන්ත්‍රාත් කාලය 2019 නොවැම්බර් 02 දින සිට 2020 නොවැම්බර් 29 දක්වා පැවතියද 2021 ඔක්තෝබර් 05 දින දක්වා තවත් මාස 10 ක කාලයක් කල් දිගුවක් ලබාදී තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 ප්‍රකාරව උක්ත ඉදිකිරීම් සඳහා සාධාරණ කාලය සති 40 ක් වුවත්, මෙම ඉදිකිරීම් සඳහා සති 100 ක් පමණ මේ අනුව ගතකර තිබුණි. | -එම- | -එම- |
| (ii) වාරියපොල ප්‍රාදේශීය ඉංජිනේරු විසින් උක්ත කර්මාන්තය 2021 ඔක්තෝබර් 05 දින අවසන් කර තිබුණු බව අවසන් බිල්පත අනුව සනාථ කර තිබුණු නමුත් උක්ත ගොඩනැගිල්ල විධිමත් ලෙස වාරියපොල අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය වෙත භාර දී තිබුණේ 2022 අප්‍රේල් 06 වන දින වූයෙන් ගොඩනැගිල්ල භාර දීමට තවත් මාස 06 ක් ප්‍රමාදවී තිබුණි. | -එම- | -එම- |
| (iii) 2023 අප්‍රේල් 06 දින වන විට වැඩ අවසන් වූ තාවකාලික ප්‍රවේශ මාර්ගයක් හා තාවකාලික විදුලි සැපයුමක් සමඟ විවෘත කර තිබූ ගොඩනැගිල්ල විගණිත දින වූ 2023 අප්‍රේල් 18 දින වන විට තාවකාලික විදුලි සැපයුම අවසන්වී තිබූ අතර කිසිදු වැඩ සටහනක් පවත්වා හෝ පැවැත්වීමට සැලසුම් කර හෝ නොතිබුණි. | -එම- | -එම- |
| (iv) ඉහත ගොඩනැගිල්ල සඳහා වාරියපොල අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථානය විසින් තෙකලා ඇම්පියර් 60 ක සැපයුමක් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලා තිබුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| නමුත් විදුලිබල මණ්ඩල විසින් දන්වා තිබුණේ මෙම පරිශ්‍රය සඳහා ලබාදිය හැකි සාමාන්‍ය සැපයුම්වල උපරිම ධාරිතාවය වන 42 KVA ඉක්මවා යන බැවින් මණ්ඩලයේ නීති රීති අනුව මෙම සැපයුම ලබාදිය නොහැකි බවයි. ඒ අනුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ප්‍රකාරව පූර්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රසම්පාදන අස්ථිත්වයේ වගකීම් භාරයක් වන උපයෝගිතා සේවාවන් පිළිබඳ සලකා බැලීමක් සිදුකර නොමැති බව මෙහිදී විගණනයට නිරීක්ෂණය විය. | | |
| (v) විදුලි සැපයුම් සඳහා වූ ඇස්තමේන්තු මුදල වූ රු.මිලියන 1.8 ක් 2022 ඔක්තෝබර් 05 දින කුරුණෑගල ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවා තිබුණි. එමෙන්ම ඉන් මාස 05 කට පමණ පසු 2023 මාර්තු 20 දින වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් මෙම මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විදුලි බෙදාහැරීමේ පද්ධතිය සඳහා රු. මිලියන 5 ක ඇස්තමේන්තුවක් ලබා දී තිබුණ නමුත් විගණිත දිනය වූ 2023 අප්‍රේල් 20 දක්වාම ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. | -එම- | -එම- |
| (ආ) 2023 අප්‍රේල් 18 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී විවෘත කර තිබූ උක්ත ගොඩනැගිල්ලෙහි පහත අඩුපාඩු නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | නියමිත පරිදි වැඩ සිදු කරන බවට සහතික කිරීම සඳහා නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (i) සවිකර තිබූ දොරවල් , දොර අගුල් සවි ශක්තිමත්භාවය අඩු බව මෙන්ම කැඩී ගොස් ඇති බව නිරීක්ෂණය විය. | | |
| (ii) වැසිකිලි පද්ධතියෙන් ජලය සම්පූර්ණයෙන්ම කාන්දු වීමකට ලක්ව පවතින බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) මෙම මධ්‍යස්ථානයෙහි භූමිය සකස් කිරීම සඳහා රු.මිලියන 4.6 ක මුදලකට වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2022 ඔක්තෝබර් 25 දින ඉදිකිරීම් සමාගමක් සමඟ ගිවිසුම්ගතව ඉදිකිරීම් කටයුතු සිදුකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | නියමිත පරිදි වැඩ සිදු කරන බවට සහතික කිරීම සඳහා නිසි අධීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (i) භූමි අලංකරණය තුළ ජලය බැස යාමේ ක්‍රමවේදයක් නිර්මාණය කර නොතිබුණි. ගොඩනැගිල්ලෙහි පිටුපස ජලය බැස යාමට කාණුවක් කැපීම සිදු කර තිබුණ මුත් එයට එකතු වන ජලය බැස යාමට ක්‍රමවේදයක් නොවුණි. | | |
| (ii) භූමි අලංකරණය හරහා ගොඩනැගිල්ලට ප්‍රවේශ වීම සඳහා පියගැට පෙළක් මෙන්ම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට ප්‍රවේශ වීමේ ක්‍රමවේදයක් | | |

නිර්මාණය කර නොතිබුණි. එහෙත් ගොඩනැගිල්ල අභ්‍යන්තරයේ එවැනි ක්‍රමවේදයක් නිර්මාණය වී තිබුණද භූමියේ සිට එයට පිවිසීමට ක්‍රමවේදයක් නොවූයෙන් ගොඩනැගිල්ලෙහි පවතින විශේෂ අවශ්‍යතා ඇති පුද්ගල ප්‍රවේශ මාර්ගයද නිශ්කාර්යය වන බව නිරීක්ෂණය විය.

### 3.5 මතභේදාත්මක ස්වභාවයේ ගැටලු

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | උපදේශක සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.5 (i), 4.3 සහ 4.4 ඡේදවල සඳහන් කර ඇති විධිවිධානවලට පටහැනිව 2021 වර්ෂයේදී උපදේශකයින් වෙත රුපියල් මිලියන 8 ක වැටුප් ගෙවා ඇති අතර එම කාලය තුළ සේවයේ යෙදී සිටි උපදේශකයින් ව්‍යාපෘතියට අදාළව ප්‍රමාණවත් සේවාවක් ඉටු කළ බව තහවුරු වී නොවිය. | උපදේශක සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනි කිසිවක් සිදුවී නොමැති බව දන්වා සිටීමට කැමැත්තෙමි. අවශ්‍ය අවස්ථාවේදී ගෙවූ මුදලට වඩා විශාල සේවයක් මේ නිලධාරීන්ගෙන් මට ලැබුණු බව සඳහන් කිරිමට කැමැත්තෙමි. | අනවශ්‍ය තනතුරු අහෝසි කර රජයේ වියදම් අඩු කළ යුතුය. |
| | **වයඹ පළාත** | | |
| (i) | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපාතිය යටතේ ගණිත ඉගෙනීම සහ ගණිත ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 3.7 ක වටිනාකමකට Trapezoid මේස 156 ක් සමාලෝචිත වර්ෂයෙහි මිල දී ගෙන බෙදාහැර තිබුණි. Trapezoid යන ගණිත න්‍යායට අනුව ගණිත ක්‍රියාකාරකම් සඳහා සුදුසු මේස මිල දී ගත යුතු වුවත්, ප්‍රසම්පාදන අස්ථිත්වය හා, තාක්ෂණික ඇගයීම් කමිටුව එම අවශ්‍යතාවය නොසලකා නිවැරදි නිර්දේශ ලබා නොදීම මත මිලදී ගෙන තිබූ මෙම මේස එම ගණිත ක්‍රියාකාරකම් සඳහා සුදුසු නොවන සාමාන්‍ය මේස බවත් නිරීක්ෂණය විය. ඒ අනුව නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි ගණිතය දැනුම වර්ධනය කිරීම සඳහා ලබා දෙන ලෝක බැංකු ණය නිශ්කාර්යව යෙදවෙන බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | මිලදී ගැනීම් සිදු කිරීමේදී අවශ්‍යතාවය පිළිබඳව සැලකිලිමත් විය යුතුය. |
| (ii) | මෙම ව්‍යාපෘතිය යටතේ 'පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන' (SBLEG) ලෙස කලාප කාර්යාල 08 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 102 ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබුණි. උක්ත ප්‍රදාන, කලාප කාර්යාල විසින් අවසන් ගෙවීමක් ලෙස එම මුදල් පාසල් සංවර්ධන සමිති ගිණුමට සෘජුවම බැරකර තිබුණු අතර ඒ සම්බන්ධව පසු විපරමක් ද සිදුකර නොතිබුණි. එම මුදල් ලැබුණු ප්‍රභවය පිළිබඳව විදුහල්පතිවරුන්ගේ දැනුවත්භාවයක් නොමැති බවද නිරීක්ෂණය විය. ප්‍රදාන, පාසල් වලට ලබාදීමේ දී රු.250,000 ක උපරිමයකට යටත්ව බෙදා හැර තිබුණි. එම | අදහස් දක්වා නොමැත. | ලබා දුන් මුදල් වියදම් කරන ආකාරය සම්බන්ධයෙන් පසු විපරම් සිදු කළ යුතුය. |

මුදල ව්‍යාපෘතියෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පාසල් සංවර්ධනයට හෝ ව්‍යාපෘතියෙහි කාර්යසාධනයට ප්‍රමාණවත් මුදලක් නොවන බව නිරීක්ෂණය විය.

**4.** **ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති ඇගයුම් ලේඛනයට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වැය කිරීමට ඇති මුළු මුදල රු. මිලියන 24,161 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 66.24 කි. කෙසේ වෙතත් 2022 දෙසැම්බර් 31 දිනට වැය කර තිබුණේ රුපියල් මිලියන 5,086ක් පමණි. ව්‍යාපෘතියේ සමුච්චිත මූල්‍ය ප්‍රගතිය සියයට 21.05කි. | අදහස් දක්වා නොමැත. | ක්‍රියාත්මක කරන ආයතන විසින් ප්‍රමාදයන් ආවරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු ය. |

**5.** **පද්ධති හා පාලනයන්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය සඳහා වෙන වෙනම මුදල් ලැබී තිබුණද මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අවශ්‍ය මූලික පොත්පත් සහ ගිණුම් නිසි පරිදි නඩත්තු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික ගිණුම් පොත් නිසි පරිදි පවත්වාගෙන යන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | පොත්පත් සහ ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | බෙදා හැරීමෙන් පසු උපකරණ භාවිතය පිළිබඳ පසු විපරම් කිරීමට අපොහොසත් වී තිබුණි. | උපකරණ සම්පූර්ණයෙන් භාවිතා කරන ලෙස සියලුම විදුහල්පතිවරුන්ට දැනුම් දී ඇති අතර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල හරහා අධීක්ෂණ කටයුතු සිදු කිරීමට උපදෙස් නිකුත් කරන ලදී. | පසු විපරම් ක්‍රියාපටිපාටි වගකිව යුතු පාර්ශවයන් විසින් නියමිත වේලාවට සිදු කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය MOE, MPAHA සහ PLG සහ PEAs යන ආයතනවල අභ්‍යන්තර ඒකක මගින් සිදුකිරීමට බලාපොරොත්තු වුවද, ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණන කටයුතු පළාත් සහ අභ්‍යන්තර විගණන ඒකක මගින් සිදු කර නොතිබුණි. | පළාත් පාලන ආයතනවලට උපදෙස් ලබා දී ඇත. | රෙගුලාසි මගින් අවශ්‍ය පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට ක්‍රියා කළ යුතුය. |